සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# දෙවන වාර පරීක්ෂණය 2018

# නර්තනය

7 ශ්‍රේණිය

කාලය පැය 02 යි.

නම/ විභාග අංකයඃ

## I - කොටස

- සියළුම ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුරු සපයන්න.
- අංක 01 - 05 දක්වා ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුර තෝරන්න.

01 නර්තනයේ මූලික අංගහාරය වනුයේ,

(i) පා සරඹයි. (ii) නමස්කාරයයි.

(iii) මණ්ඩියයි. (iv) ගොඩසරඹයි.

02 'තා තෙයියත් තා තෙයියත් තා තෙයියත් තා තෙයි.' මෙහි සරඹ නාමය වන්නේ,

(i) පසුපෙර අඩියයි. (ii) දැල අඩියයි.

(iii) සිවු අඩියයි. (iv) තුන් අඩියයි.

03 දෙතිතේ තාල ප්‍රභේදයකි.

(i) සුළු තනි තිත (ii) මැදුම් තනි තිත

(iii) මහ තනි තිත (iv) සුළු මැදුම් දෙතිත

04 'සඳවට තරුවැල් ඇවිදින් කළඑළි සද්දේ' යන කවිය අයත් වන්නේ,

(i) ගොයම් නැටුම ය. (ii) පතුරු නැටුම ය.

(iii) තාලම් නැටුම ය. (iv) සවරම් නැටුම ය.

05 විකල්ප වාද්‍යය භාණ්ඩවලට අයත් වේ.

(i) රබාන (ii) උඩැක්කිය (iii) දඬුබෙරය (iv) තාලම්පට

- ප්‍රශ්න අංක 06 - 10 දක්වා ඇති ප්‍රශ්නවලට වරහන් තුළ දී ඇති ඉතා නිවැරදි පිළිතුර තෝරා හිස්තැන් පුරවන්න.

06 ................................................................. රාමසාන් උත්සවයේ දක්නට ලැබෙන ප්‍රධාන ආගමික චාරිත්‍රයකි.

07 ................................................................................................................. උඩරට නර්තන සම්ප්‍රදායට අයත් වේ.

08 'දොං ජිංත ගත දොංත' බෙර පදය ............................................................................ මගින් වාදනය කරයි.

09 ............................................................................................ ආධුනිකයාගේ හිසමත සුබ නැකතකට අනුව පළඳවයි.

10 ................................................................................................................ කෘෂි කර්මාන්තය හා බැඳි ගැමි නැටුමකි.

(ගැටබෙරය, වෙස් ඇඳුම් කට්ටලය, උපවාස ශීලය, ඡටාව, කුළු නැටුම)

- **අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවලට හරි නම් (✓) ලකුණ ද , වැරදි නම් (×) ලකුණ ද වරහන් තුළ යොදන්න.**

11 සතුටින් නම්‍යතා ආභ්‍යාස කිරීම නිසා මානසික සුවය ඇති වේ. ( )

12 ගුරුවරම් දීමේ මංගල්‍ය උඩරට සම්ප්‍රදායට අයත් වේ. ( )

13 දෑත ගෙන නර්තනය කිරීම ගොඩ සරඹ වල ලක්ෂණයකි. ( )

14 දෙවොල් දෙවියන් කොහොඹා කංකාරි ශාන්ති කර්මයේ පුද ලබයි. ( )

15 හත් අඩියේ භාවිත පියුම සූනියම් ශාන්ති කර්මයට අයත් වේ. ( )

- **අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවලට A තීරුවේ ගැලපෙන පිළිතුර B තීරුවෙන් තෝරා යා කරන්න.**

| | **A තීරුව** | **B තීරුව** |
|---|---|---|
| 16 | ස්වාභාවික අමු ද්‍රව්‍යයකි. | දෑල අඩිය |
| 17 | විකල්ප වාද්‍යය උපකරණයකි. | ගැට බෙරය |
| 18 | දික් දිගට කොළ ඇති | ගොප් කොළ |
| 19 | තේයිති තාතෙයි | මාත්‍රා 2 + 3 තාලය |
| 20 | උඩරට නර්තන සම්ප්‍රදාය | වැලි පිරවූ බෝතලය |

## II කොටස

- **පළමු ප්‍රශ්නය ඇතුළුව තවත් ප්‍රශ්න 03 කට පමණක් පිළිතුරු සපයන්න.**

01 ඔබ පංති කාමරයේදී කරන්නට යෙදුණු 'පෙරහැර' තේමා කරගත් සමූහ වාදන ක්‍රියාකාරකම ඇසුරින් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) දවුල, තම්මැට්ටම, හොරණෑව යන සාම්ප්‍රදායික වාද්‍යය භාණ්ඩවලට ආදේශ කළ හැකි විකල්ප වාද්‍ය උපකරණ 03 ක් නම් කරන්න.

(ii) පහත වගුවට ගැලපෙන විකල්ප වාද්‍ය උපකරණ 02 බැගින් ලියන්න.

| සෙලවීමෙන් හඬ උපදවන භාණ්ඩ | පිඹීමෙන් හඬ උපදවන භාණ්ඩ | තට්ටු කිරීමෙන් හඬ උපදවන භාණ්ඩ |
|---|---|---|
| 1.<br>2. | 1.<br>2. | 1.<br>2. |

(iii) 'පෙරහැර' තේමාවට ගැලපෙන වාදන කණ්ඩයක් සකස් කර ගැනීමට ඔබ යොදා ගන්නා විකල්ප වාදන උපකරණය පහත වගුවේ ගැලපෙන ලෙස ලැයිස්තු ගත කරන්න.

| | පෙරහැර | |
|---|---|---|
| | ක්‍රියාකාරකම | විකල්ප වාද්‍ය භාණ්ඩය |
| උදා:- | පඬුරු පෙට්ටිය සෙලවීම. | ටොනික් මූඩි වල් වළල්ල |
| 1. | කස පිපිරවීම. | |
| 2. | ඇතාගේ ගමන් හඬ | |
| 3. | හේවිසි වාදනය | |
| 4. | ලී කෙලි නැටුම | |
| 5. | පතුරු නැටුම | |

02 ගැමි නැටුමෙන් ගැමියාගේ අව්‍යාජ ලක්ෂණ ප්‍රකට කෙරේ.

(i) තාලය ඉස්මතු කරමින් ඉදිරිපත් කරනු ලබන ගැමි නැටුම් 02 ක් නම් කරන්න.

(ii) ගැමි නැටුම් 04 ක් නම් කර, ඊට අදාළ රංග උපකරණ 04 ක් ඉදිරියෙන් ලියන්න.

(iii) ගැමි නැටුමට උචිත ගැහැණු හා පිරිමි රංග වස්ත්‍රාභරණ නම් කරන්න.

03 දවුල වූ කලී සබරගමු නර්තන සම්ප්‍රදායේ අනන්‍යතාව දක්වන ප්‍රධාන සම්ප්‍රදායික වාද්‍යය භාණ්ඩය වේ.

(i) පුරාණයේ දවුල වාදනය කළ අවස්ථා 02 ක් ලියන්න.

(ii) දවුල සකස් කර ගැනීමට යොදා ගන්නා දැව වර්ග 02 ක් හා හම් වර්ග 02 ක් නම් කරන්න.

(iii) දවුල ඇඳ එහි කොටස් නම් කරන්න.

04 "විවිධ ජනවර්ග හා බැඳි සංස්කෘතික උත්සව නරඹමු. අගයමු. ඒවා සුරක්ෂා කරමින් මතු පරපුරට පවරා දෙමු."

(i) ඉස්ලාම් ආගමිකයින්ගේ ශුද්ධ වූ ග්‍රන්ථය නම් කරන්න.

(ii) උපවාස කිරීමෙන් බැතිමතුන් තුළ ඇතිවන ගුණාංග 03 ක් ලියන්න.

(iii) රාමසාන් උත්සවයේ ආගමික හා සංස්කෘතික වටිනාකම රැක ගැනීමට ඔබ ගන්නා ක්‍රියාමාර්ග 02 ක් ලියන්න.

05 පහත සඳහන් මාතෘකාවලින් 02 ක් තෝරා ගෙන කෙටි සටහන් ලියන්න.

(i) මණ්ඩිය

(ii) ගැමි නැටුම්

(iii) හිස වෙස් බැඳීමේ මංගල්‍යය

(iv) කස්තිරම

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | |
|---|---|---|---|
| 01 iii | 06 උපවාසශීලය | 11 ✓ | 16 ගොප්කොළ |
| 02 i | 07 වෙස් ඇඳුම් කට්ටලය | 12 X | 17 වැලි පිරවූ බෝතලය |
| 03 iv | 08 උඩරට බෙරය | 13 ✓ | 18 මාත්‍රා 2 + 3 |
| 04 iii | 09 ජටාව | 14 X | 19 දැල අඩිය |
| 05 iii | 10 කුළු නැටුම | 15 ✓ | 20 ගැටබෙරය |

(ලකුණු 1 x 20 = 20)

## II කොටස

01 (i) දවුල - ටිං බෙරය, තම්මැට්ටම - එක්ස්රේ කොළ යොදා සකස් කළ අයිස් ක්‍රීම් කප් දෙක ල. 02
හොරණෑව - ගොප් කොළ නලාව

(ii)

| | සෙලවීමෙන් හඬ උපදවන භාණ්ඩ | පිඹීමෙන් හඬ උපදවන භාණ්ඩ | තට්ටු කිරීමෙන් හඬ උපදවන භාණ්ඩ |
|---|---|---|---|
| 1. | ටොනික් මූඩි මල් වලල්ල | පැපොල් බට නලාව | දඬු බෙරය |
| 2. | වැලි පිරවූ බෝතලය | පොල්කොළ බටනලාව | ටින් බෙරය |

ල. 1/2 x 6 =03

(iii)

| ක්‍රියාකාරකම | විකල්ප වාද්‍ය භාණ්ඩය |
|---|---|
| 1. කස පිපිරවීම. | දෙකට ඉරූ පොල් කොළය හෝ ලණුවක් |
| 2. ඇතාගේ ගමන් හඬ | බෝතලයකට (කට නොවැසූ) කාසි දැමීම |
| 3. හේවිසි වාදනය | ටින් බෙරය, ගොප්කොළ නලාව අයිස්ක්‍රීම් කප් තම්මැට්ටම |
| 4. ලී කෙලි නැටුම | ලී ශබ්දය |
| 5. පතුරු නැටුම | පොල්කටු ශබ්දය |

02 (i) ලී කෙළි නැටුම, තාලම් නැටුම ල. 02
(ii) සිසුන් ලියා ඇති ගැමි නැටුම් වල රංග උපකරණ නම් කර ඇත්නම් ල. 04
(iii) ගැහැණු - චීත්තය, හැට්ටය, පබළු මාලය
පිරිමි - සරම, බැනියම, ජටාව, ලේන්සුව ල. 04
මුළු ලකුණු 10

03 (i) අණබෙර, මළබෙර, රණබෙර, වදබෙර ල. 02
(ii) දැව - ඇහැළ, කොහොඹ, කොස්, මිල්ල, කිතුල්
හම් - එළුහම, හරක් හම ල. 04
(iii) දවුල ඇඳ කොටස් නම් කර ඇත්නම් ල. 04
මුළු ලකුණු 10

04 (i) "අල්කුර්ආනය" ල. 02
(ii) ♦ ඉවසීමේ ගුණය වර්ධනය වීම. ♦ රාමසාන් උත්සවය දුප්පත් පොහොසත් භේදයකින් තොරව එකසේ භුක්ති විඳීම. ♦ සමාජ අසමානතාවයන් දුරු වීම. ♦ පරිත්‍යාගශීලීභාවය වර්ධනය වීම. ල. 04
(iii) ♦ මෙවැනි උත්සව ජනමාධ්‍යගත කර එහි ඇති සංස්කෘතික වටිනාකම අන්‍ය ජාතීන්ට ද අගය කිරීමට අවස්ථා සලසා දීම. ♦ එමගින් ජාතික සමගිය වර්ධනය වීමට ඉඩ ප්‍රස්තා සැලසීම. ♦ මතු පරපුර වෙනුවෙන් මෙවැනි උත්සව සංරක්ෂණය කිරීමේ වැඩ පිළිවෙලක් ඇති කිරීම. ල. 04
මුළු ලකුණු 10

05 අදාළ මාතෘකාව යටතේ කරුණු ගොනු ගත කර තිබේනම් ලකුණු ලබා දෙන්න.
එක් කරුණකට ලකුණු 1 බැගින් 05
මාතෘකා ලකුණු 2 x 5 මුළු ලකුණු 10